**<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023.01.12 වන දින පැවැති මාසික මහ සභා රැස්වීම් වාර්තාව.</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2023 ජනවාරි මස 12 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති වතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.12.08 )**

2022.12.08 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.12.08 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

සභිකවරුන්ගේ මාසික දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් විගණනය විසින් අනාවරණය කර ඇති බවත් , එනිසා පහත පරිදි ගෙවීම් සිදු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්ගේ 2023.01.03 දිනැති ACLG/AD/1/7/2022/3 අංක සහිත ලිපියෙන් දන්වා එවා ඇති බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

- සභිකයින්ගේ මාසික දීමනා ගෙවීමේ දී 2005.06.08 දිනැති 1396/18 ගැසට් පත්‍රය මඟින් විෂය භාර අමාත්‍යවරයා පනවන ලද රීති අනුව කටයුතු කිරීම.
- සම්පූර්ණ මසක කාලයක් ආවරණ නොවන අවස්ථාවල අදාල වන දින ගණනට අනුපාතිකව ගණනය කර දීමනා ගෙවීම.

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**
**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**
**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** රටේ පවතින උද්ධමන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර පළාතේ ආර්ථික අපහසුතාවයට ලක්ව ඇති පවුල් වල දරුවන් සඳහා 2023 නව පාසල් වාරය වෙනුවෙන් අවශ්‍ය වන පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය සහා අරමුදල් මඟින් වැය දරා ලබා දීම සඳහා වැඩසටහනක් සකස් කරන ලෙස සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව මැතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති බව පළාත් පාලන කොමසාරිස්තුමා CLG/DE/03 අංක දරණ 2022.12.12 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.ඒ අනුව ලබා දී ඇති උපදෙස් වලට අනුව පැල්මඩුල්ල බල සීමාවේ ආර්ථික අපහසුතාවයට ලක්ව ඇති පවුල් වල දරුවන් සඳහා රු.ලක්ෂ 15කට යටත්ව පාසල් උපකරණ ලබා දීමට යෝජනා කරමි.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනාවට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු නිසා පළාත් පාලන කොමසාරිස්ට යොමු කළ යුතු බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ මෙම යෝජනාව අනුව ආර්ථික අපහසුතාවයට ලක්ව ඇති පවුල් වල දරුවන් සඳහා උපකාරයක් කිරීමට හැකියාවක් පවතින්නේ නම් අනිවාරයෙන් ම සිදු කළ යුතු බව ය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 01</u>**
ඉහත යෝජනාව සලකා බලා ලබා දී ඇති උපදෙස් වලට අනුව රටේ පවතින උද්ධමන තත්ත්වය හේතුවෙන් පැල්මඩුල්ල බල සීමාවේ ආර්ථික අපහසුතාවයට ලක්ව ඇති පවුල් වල දරුවන් සඳහා 2023 නව පාසල් වාරය වෙනුවෙන් අවශ්‍ය වන පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය රු.ලක්ෂ 15 මුදලකට යටත්ව , ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**02.** වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හේතු කොට ගෙන , කොට්ඨාසයේ බොහොමයක් පවුල් දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටින බවත් , ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන වැඩ සටහන - 2022 යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් අඩු බර තත්ත්වයේ ළමයි 72ක් හඳුනාගෙන ඇති බවත් , එම තොරතුරු අනුව පවුල් 50කට දැඩි ආර්ථික දුෂ්කරතා පවතින බවට වසම් භාර සංවර්ධන නිලධාරී මඟින් හඳුනාගෙන ඇති බවත් , ඔවුන් වෙනුවෙන් මාස 06 ක හෝ පෝෂදායි වියළි සලාකයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් පැල්මඩුල් ප්‍රාදේශීය ලේකම් විසින් ලිපියක් එවා ඇත.මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනාවට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු නිසා පළාත් පාලන කොමසාරිස්ට යොමු කළ යුතු බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ මෙය අත්‍යවශ්‍ය කාරණාවක් ලෙස සලකා සිදු කළ යුතු බව ය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය සලකා බලා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව , වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන වැඩ සටහන - 2022 යටතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හඳුනා ගෙන ඇති අඩු බර තත්ත්වයේ ළමයි 72 වෙනුවෙන් එම පවුල් 50ට මාස 06 ක පෝෂදායි වියළි සලාකයක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

පෙ.ව.10.05 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

**03.** විදුලි බිල්පත් හා ජල බිල්පත් ගාස්තු ශීඝ්‍ර වශයෙන් ඉහල ගොස් ඇති බැවින් සතිපොළ හා සතිපොළ අසල රථගාල භූමිය කුලියට දීමේ දී විදුලිය හා ජලය භාවිතා කරන්නේ නම් පමණක් 2023 සිට අයකරනු ලබන රු.7,500.00 දෛනික ගාස්තුවට අමතරව පහත ගාස්තු ද අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | කාරණය | විදුලිය හා ජලය භාවිතා කරන්නේ නම් පමණක් අය කිරීමට සිදුසු යැයි යෝජනා කරන මුදල (රු.) |
|---|---|---|
| 01 | සතිපොළ හා සතිපොළ අසල රථ ගාල භූමිය නොමිලේ ලබා දීම. | රු.1000.00 |
| 02 | සංගීත සංදර්ශන වැනි විදුලිය හා ජලය විශාල වශයෙන් භාවිතා කරන අවස්ථාවක | රු.3000.00 |
| 03 | අනෙකුත් සංදර්ශන සඳහා (විදුලිය හා ජලය සුලු වශයෙන් භාවිතා කරන අවස්ථාවක) | රු.1000.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 03</u>**
විදුලි බිල්පත් හා ජල බිල්පත් ගාස්තු ශීඝ්‍ර වශයෙන් ඉහල යාම නිසා සතිපොළ හා සතිපොළ අසල රථගාල භූමිය කුලියට දීමේ දී විදුලිය හා ජලය භාවිතා කරන්නේ නම් පමණක් 2023 සිට අයකරනු ලබන රු.7,500.00 දෛනික ගාස්තුවට අමතරව ඉහත ගාස්තු ද අය කිරීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කිරිඳි ඇල්ලෙහි යටිතල පහසුකම් සංවර්ධනය කර සංචාරක කලාපයක් කිරීම සඳහා 2023 වර්ෂයේ සිට ඉදිරියට වසර 03ක කාලයකට බදු දීමට අදාලව සකස් කරන ලද ගිවිසුම අනුමත කර ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 04</u>**
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කිරිඳි ඇල්ලෙහි යටිතල පහසුකම් සංවර්ධනය කර සංචාරක කලාපයක් කිරීම සඳහා 2023 වර්ෂයේ සිට ඉදිරියට වසර 03ක කාලයකට බදු දීමට අදාලව සකස් කරන ලද ගිවිසුම අනුමත කිරීමටත් , මෙම බදුකරුගේ ඉල්ලීම පරිදි වසර 10 ක කාලයකට දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**05.** ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය , දිස්ත්‍රික් සහාය ඒකකය - රත්නපුර වෙතින් 2023.01.04 දින එවන ලද ලිපියට අනුව දොඹගස්වින්න ග්‍රාමීය ජල ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ප්‍රතිලාභීන් 216ක් පමණ සිටින බවත් , බැංකු ගිණුමක එයින් ලැබෙන ඉතිරිය තැන්පත් කර ඇති බවත් , ලක්ෂයක පමණ මුදලක් මාසිකව එකතු කරමින් සාමාන්‍ය පරිදි එය නඩත්තු කර ගෙන යන බවත් , අලුත්වැඩියාවන් නොමැතිනම් මුදල් ඉතිරි වන ව්‍යාපෘතියක් බවත් , මෙම ව්‍යාපෘතිය මඟින් ජලය ලබා ගන්නා ජනයාගෙන් මේ සම්බන්ධව අදහස් විමසා බැලීම සුදුසු බවත් , එහි සේවකයන් දෙදෙනෙක් රාජකාරි කටයුතු වල නිරත වන බවත් , නඩත්තු කටයුතු සාමාන්‍ය පරිදි වන බවට තමන් පෞද්ගලිකව දන්නා බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙය සභාවට පවරා ගැනීම සඳහා සභාවෙන් කිසිම ඉල්ලීමක් නොකළ බවත් , ප්‍රජා ජල ව්‍යාපෘතියේ සේවකයින් අතින් මෙහි මුදල් අක්‍රමිකතාවක් සිදු වන නිසා මෙය ඉදිරියට පවත්වා ගෙන යාමට අපහසු බැවින් මෙය පවත්වා ගෙන යන මෙන් සභාවෙන් මෙසේ ඉල්ලීමක් සිදු කර ඇති බවත් , ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟින් විශාල පරීක්ෂණ බොහොමයක් සිදු කර සභාවට මෙය ලබා දීමට තීරණය කර ඇති බවත් , ලැබෙන මුදල් හා සසදා බලන විට මෙම ගැටළුව මතු වී ඇති බවත් , සභාවට එය පවරනවානම් එහි ක්‍රමවේදය වෙනස් කර රාජ්‍ය දේපලක් ලෙස පවරා ගැනීමට සිදු වන බවත් , එහි පාලනය සභාව විසින් කිරීමට සිදු වන බවත් , එවිට සභාවන් සේවකයින් යෙදවීමට සිදු වන බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ජනතාවගෙන් විමසා මෙය සභාවට පවර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය පවසා සිටියේ මෙහි මුදල් අක්‍රමිකතා සිදු වන බවත් , සභාවට පවරා ගෙන සිදු කරනවානම් වටිනා බවත් , මහා සභාවක් පවත්වා ජනතාවගෙන් කැමැත්ත විමසා මෙය සභාවට පවර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් ය.

මෙය විශාල මුදලක් වැය කර සකස් කළ ව්‍යාපෘතියක් බවත් , ජලය අපතේ යන ප්‍රමාණය වැඩිපුර පෙන්වන බවත් බිල් වලින් අඩුවෙන් පෙන්වන බවත් , මහා සභාවක් කැඳවා අදහස් ලබා ගෙන සභාවට පවර ගැනීම සම්බන්ධව තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>**තීරණ අංක 05**</u>

ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය , දිස්ත්‍රික් සහාය ඒකකය - රත්නපුර වෙතින් 2023.01.04 දින එවන ලද ලිපිය සලකා බලා , එම ප්‍රදේශයේ ජනතාව රැස් කර මහා සභාවක් පවත්වා ජනතාවගේ කැමැත්ත විමසා ඉන්පසුව දොඹගස්වින්න ග්‍රාමීය ජල ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** පැල්මඩුල්ල පොදු වෙළඳපොළ වම්පස 01 දරණ කඩ කාමරය බදු පදනම මත පවත්වාගෙන යනු ලැබූ පී.ඩී.ප්‍රේමරත්න යන අය 2022.04.23 දින මිය ගොස් ඇති අතර එතුමා විසින් මරණින් පසු බදු අයිතිය පැවරීම සඳහා පුද්ගලයෙකු නම් කිරීමක් සිදු කර නොමැත. පී.ඩී.ප්‍රේමරත්න යන අයගේ බිරිඳ වන ඩී.කේ.සී.පී.ජයතිලක යන අය විසින් මෙම කඩ කාමරයේ බදු අයිතිය ඇයට පවරා දෙන ලෙස ඉල්ලුම් කර ඇත.සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 06**</u>

පැල්මඩුල්ල පොදු වෙළඳපොළ වම්පස 01 දරණ කඩ කාමරය බදු පදනම මත පවත්වාගෙන යනු ලැබූ පී.ඩී.ප්‍රේමරත්න යන අය 2022.04.23 දින මිය ගොස් ඇති අතර මරණින් පසු බදු අයිතිය පැවරීම සඳහා පුද්ගලයෙකු නම් කිරීමක් සිදු කර නොමැති නිසා පී.ඩී.ප්‍රේමරත්න යන අයගේ බිරිඳ වන ඩී.කේ.සී.පී.ජයතිලක යන අය විසින් කර ඇති ඉල්ලීම සලකා බලා මෙම කඩ කාමරයේ බදු අයිතිය ඇයට පවරා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**07.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් තුළ පැවති පියවා ගත නොහැකි හා කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි හිඟ සේවක ණය මුදල රු.82,394.70 කි.

| අනු අංකය | නම | ණය මුදල (රු.) |
|---|---|---|
| 01 | නිලන්ත ප්‍රදීප් කුමාර | 3755.00 |
| 02 | ජී.ඩබ්.ජී.නිහාල් | 4450.00 |
| 03 | එන්.පාලිත නන්දසිරි | 7000.00 |
| 04 | ජී.එම්.දමයන්ති | 6100.00 |
| 05 | මානෙල් ජයසිංහ | 1050.00 |
| 06 | එම්.වීරන් | 1500.00 |
| 07 | කේ.බී.වී.පද්මසිරි | 44354.00 |
| 08 | ඩබ්.එන්.එස්.ප්‍රනාන්දු | 6086.00 |
| 09 | බී.අයි.රාජපක්ෂ | 6299.10 |
| 10 | මහින්ද රෝහිත ප්‍රියන්ත | 1800.00 |
| එකතුව | | 82394.70 |

මෙම රු.82,394.70 ක මුදල කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ඉදිරියට මෙවැනි ගැටළු මතු නොවන ආකාරයට කටයුතු කිරීමට වගබලා ගත යුතු බව ය.

<u>**තීරණ අංක 07**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් තුළ පැවති පියවා ගත නොහැකි හා කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි ඉහත නිලධාරීන්ගේ හිඟ සේවක ණය මුදල වන රු.82,394.70 ක මුදල කපා හැරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**08.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පැල්මඩුල්ල විද්‍යාල මාවතේ පිහිටි වරිපනම් අංක 11/1 දරණ කඩ කාමරය නීත්‍යානුකූල නොවන අයුරින් අතුරු බදු දීම පිළිබඳව 2022.05.27 දින පැවති විමර්ෂණ කමිටුවේ වාර්තාව අනුමත කිරීමට සභාවට ඉදිරිපත් කරමි.(කමිටු වාර්තාව අමුණා ඇත.)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව සානුකම්පිතව බැලීම සුදුසු බවය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ විමර්ෂණ කමිටුවේ තීරණය ක්‍රියාත්මක කළ යුතු බවත් , එවිට සභාවේ දේපලක් ලෙස එය පවතින බවත් , එම කඩ කාමරය ටෙන්ඩර් කර ලබා දිය හැකි බවත් ය.

**තීරණ අංක 08**
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් පැල්මඩුල්ල විද්‍යාල මාවතේ පිහිටි වරිපනම් අංක 11/1 දරණ කඩ කාමරය නීත්‍යානුකූල නොවන අයුරින් අතුරු බදු දීම පිළිබඳව 2022.05.27 දින පැවති විමර්ෂණ කමිටුවේ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**09.** අප බල ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය සභා මාර්ග ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු ආරම්භ කර දැනටත් සභාවේ නිලධාරීන් විසින් සිදු කරමින් පවතින අතර අදාල ස්ථාන වලට ගමන් කිරීමේ දී පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමේ දී ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ උප වගන්ති 9.2 පරිදි ගෙවීම් සිදු කිරීමටත් , රාජකාරී ස්ථානයේ සිට සැතපුම් 07 කට වඩා වැඩි දුර ප්‍රමාණයක රාජකාරී කටයුතු සිදු කරන අවස්ථාවක ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ උප වගන්ති 4:1 යටතේ ඇති සංයුක්ත දීමනා ගෙවීම අනුව අදාල ගෙවීම් සිදු කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 09**
අප බල ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය සභා මාර්ග ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු වෙනුවෙන් සභාවේ නිලධාරීන් විසින් අදාල ස්ථාන වලට ගමන් කරන විට පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමේ දී ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ උප වගන්ති 9.2 පරිදි ගෙවීම් සිදු කිරීමත් , රාජකාරී ස්ථානයේ සිට සැතපුම් 07 කට වඩා වැඩි දුර ප්‍රමාණයක රාජකාරී කටයුතු සිදු කරන අවස්ථාවක ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ උප වගන්ති 4:1 යටතේ ඇති සංයුක්ත දීමනා ගෙවීමත් සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** නිමල් මාවත,මොරතොට,ඕපනායක ලිපිනයෙහි පදිංචි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමනාකරණ හා තක්සේරු අධ්‍යානාංශයේ සිව්වන වසරෙහි ශිෂ්‍යාවක් වන බී.ඒ.යූ.ආර්.කේ.ප්‍රේමරත්න මෙනවිය අප සභාවේ විෂය පථයට අදාලව පුහුනුව ලබමින් සිටින අතර ලේකම්තුමාගේ උපදෙස් පරිදි සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වන අතර ක්ෂේත්‍රයේදී ගමන් කිරීමේ දී බස් රථ වල ගමන් කිරීමටත් , මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු වෙනුවෙන් දුරකථනය සඳහා කාඩ්පත් ලබා ගැනීමට මුදලක් වැය වන බවත් එම වියදම් පියවා ගැනීම සඳහා සාධාරණ මුදලක් ලබා දෙන ලෙසත් ඉල්ලීම් කර ඇත.සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 10**
නිමල් මාවත,මොරතොට,ඕපනායක ලිපිනයෙහි පදිංචි ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපල කළමනාකරණ හා තක්සේරු අධ්‍යානාංශයේ සිව්වන වසරෙහි ශිෂ්‍යාවක් වන බී.ඒ.යූ.ආර්.කේ.ප්‍රේමරත්න මෙනවිය අප සභාවේ විෂය පථයට අදාලව පුහුනුව ලබමින් සිටින අතර ලේකම්තුමාගේ උපදෙස් පරිදි සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වන අතර ක්ෂේත්‍රයේදී ගමන් කිරීමේ දී බස් රථ වල ගමන් කිරීමටත් , මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු වෙනුවෙන් දුරකථනය සඳහා කාඩ්පත් ලබා ගැනීමට මුදලක් වැය වන බවත් එම වියදම් පියවා ගැනීම සඳහා සාධාරණ මුදලක් ලබා දෙන ලෙසත් කර ඇති ඉල්ලීම සලකා බලා මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු සඳහා සම්බන්ධ වන එක් දිනක් වෙනුවෙන් රු.500.00 බැගින් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**11.** කුට්ටපිටිය වත්තෙපංගුව කුඩා පාලමෙහි ඇළි අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 11**
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇස්තමේන්තු සකස් කර, කුට්ටපිටිය වත්තෙපංගුව කුඩා පාලමෙහි ඇළි අලුත්වැඩියා කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**12.** ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ ICTT පාඨමාලාව හදාරා, කාර්යස්ථ පුහුණුව සඳහා අප ආයතනය වෙත යොමු කර ඇති 74/1 , නාරංගොඩ පාර , පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.සඳුනි තාරකා මෙනවිය හට මාස 06ක පුහුණු කාලයක් සඳහා අවස්ථාව ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 12**
ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ ICTT පාඨමාලාව හදාරා , කාර්යස්ථ පුහුණුව සඳහා අප ආයතනය වෙත යොමු කර ඇති 74/1 , නාරංගොඩ පාර , පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි ජේ.ඒ.සඳුනි තාරකා මෙනවිය හට 2023.02.01 දින සිට මාස 06ක පුහුණුව සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**13.** හන්දුරුකන්ද , පැල්මඩුල්ල , ශ්‍රී වර්ධනාරාමය විහාරස්ථානයේ ඉදි කරනු ලබන සංඝාවාස ගොඩනැගිල්ල සඳහා හන්දුරුකන්ද ග්‍රාම නිලධාරීතුමියගේ කාර්යාලය අසල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමේ ඇති අනතුරුදායක කොස් ගස් දෙකක් කපා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 13**
ස්ථානීය පරීක්ෂණයක් සිදු කර කාර්මික නිලධාරීතුමාගේ වාර්තාව සලකා බලා , හන්දුරුකන්ද , පැල්මඩුල්ල , ශ්‍රී වර්ධනාරාමය විහාරස්ථානයේ ඉදි කරනු ලබන සංඝාවාස ගොඩනැගිල්ලෙහි සංවර්ධන කටයුතු සඳහා හන්දුරුකන්ද ග්‍රාම නිලධාරීතුමියගේ කාර්යාලය අසල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමේ ඇති අනතුරුදායක කොස් ගස් දෙකක් කපා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**14.** ර/ශ්‍රී රාහුල විද්‍යාලයේ 2018.11.30 දින පැවති සංවර්ධන සමිති රැස්වීමේ දී ර/ශ්‍රී රාහුල විද්‍යාලයේ නම ර/ශ්‍රී රාහුල මහා විද්‍යාලය ලෙස වෙනස් කිරීමට යෝජනා කළ බවත් , එම නම භාවිතා කිරීමට අනුමත කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දෙන ලෙසත් 2022.12.22 දිනැති ලිපිය මඟින් එම විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඉල්ලීම් කර ඇත.අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**
ර/ශ්‍රී රාහුල විද්‍යාලයේ නම "ර/ශ්‍රී රාහුල මහා විද්‍යාලය" ලෙස භාවිතා කිරීමට අනුමත කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දෙන ලෙස එම විද්‍යාලයේ විදුහල්පතිතුමිය කරන ලද ඉල්ලීම සලකා බලා සභාවේ නිර්දේශය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**15.** පැල්මඩුල්ල , ඉදිකැටිය උඩ පාර පදිංචි අඩු ආදායම්ලාභී පී.ඒ.සෝමපාල යන අයට සෙවිලි අධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 15</u>**
ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර පැල්මඩුල්ල , ඉදිකැටිය උඩ පාර පදිංචි අඩු ආදායම්ලාභී පී.ඒ.සෝමපාල යන අයට සෙවිලි අධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** කහවත්ත , රේල්පාර - පොරෝණුව පදිංචි අඩු ආදායම්ලාභී ශ්‍යාමා බලංගොඩ යන අයට සෙවිලි අධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 16</u>**
ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර කහවත්ත , රේල්පාර - පොරෝණුව පදිංචි අඩු ආදායම්ලාභී ශ්‍යාමා බලංගොඩ යන අයට සෙවිලි අධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** වැලිමළුව වතුකාරකන්ද මාර්ගයේ ඉහල කොටසේ පාර හරහා ඇති කානු දෙක සඳහා අගල් 18 අඩි 04 දිග සිලින්ඩර් 6ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී

**<u>තීරණ අංක 17</u>**
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇස්තමේන්තු සකස් කර , වැලිමළුව වතුකාරකන්ද මාර්ගයේ ඉහල කොටසේ පාර හරහා ඇති කානු දෙක සඳහා අගල් 18 අඩි 04 දිග සිලින්ඩර් 6ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**III.** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.එච්.ලක්මිණී දසනායක මැතිතුමියගේ යෝජනා.</u>**

**01.** ඉහල බෝපිටිය ප්‍රධාන මාර්ගය දෙපස වර්ෂාවත් සමඟ කැඩී ගොස් ඇති නිසා මාර්ගය දෙපස කොන්ක්‍රීට් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 25ක් , කොන්ක්‍රීට් ගල් කියුබ් 01ක් , වැලි කියුබ් 01ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.එච්.ලක්මිණී දසනායක මැතිතුමිය පවසා සිටියේ ඉහළ බෝපිටියට යන තෙක්ම මාර්ගයෙහි කාපට් එක වැහි වතුරට සේදී යන බවත් , ඒ හේතුවෙන් මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අක්කර 10 , අක්කර 31 ප්‍රදේශ වල ජනයාගේ ශ්‍රම දායකත්වයෙන් බොහෝ ද්‍රව්‍ය ලබා ගෙන ඇති බවත් , යෝජනාවෙහි සඳහන් ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කළ හොත් මාර්ගයෙහි බොහෝ කොටසක් සාදා ගැනීමට හැකි බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය සභා මාර්ගයක් නිසා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුනු පසු ද්‍රව්‍ය ලබා දිය හැකි බවත් , මෙම මාර්ගය මෙම තත්වෙන් පවත්වා ගෙන යාම පිළිබඳව ගමේ ජනතාවට ස්තූතිවන්ත වන බවත් ය.

**<u>තීරණ අංක 18</u>**
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර , ඇස්තමේන්තු සකස් කර , ඉහල බෝපිටිය ප්‍රධාන මාර්ගය දෙපස වර්ෂාවත් සමඟ කැඩී ගොස් ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සිමෙන්ති කොට්ට 25ක් , කොන්ක්‍රීට් ගල් කියුබ් 01ක් , වැලි කියුබ් 01ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**IV.** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** ගල්ලින්න , පඹහේන , කේ.ජී.චමිල මෛත්‍රීපාල මහතාගේ හා අනෙකුත් නිවාස වලට ප්‍රවේශ වීමට ඇති මාර්ගයේ පවතින ඇල සඳහා අවශ්‍ය හියුම් පයිප්ප ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 19</u>**
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇස්තමේන්තු සකස් කර , ගල්ලින්න , පඹහේන , කේ.ජී.චමිල මෛත්‍රීපාල මහතාගේ හා අනෙකුත් නිවාස වලට ප්‍රවේශ වීමට ඇති මාර්ගයේ පවතින ඇල සඳහා අවශ්‍ය හියුම් පයිප්ප ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.**මාවුදැල්ල , ර/බුලුගහතැන්න විද්‍යාලයට ඉදිරියෙන් ඇති රත්නපුර -කලවාන මාර්ගයේ රේල්පාරට පිවිසෙන පඩිපෙල (සැලුන් එක අසලින්) සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යාධාර ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 20**</u>
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇස්තමේන්තු සකස් කර , මාවුදැල්ල , ර/බුලුගහතැන්න විද්‍යාලයට ඉදිරියෙන් ඇති රත්නපුර -කලවාන මාර්ගයේ රේල්පාරට පිවිසෙන පඩිපෙල (සැලුන් එක අසලින්) සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍යාධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.**මාරපන - පඹහේන මාර්ගය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර ලබා දීමට යෝජනා කරමි.( පෙරමුසු තාර මිශ්‍රණය)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 21**</u>
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇස්තමේන්තු සකස් කර, මාරපන - පඹහේන මාර්ගය අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**V.** <u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමාගේ යෝජනා.**</u>

**01.**සිරි සුගත විහාරයේ ඉදි කිරීමට නියමිත ධර්මශාලා ගොඩනැගිල්ල සඳහා සිමෙන්ති කොට්ට 25ක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පන්සල් වලට ආධාර ලබා දීමේ දී ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවිය යුතු බව ය.

<u>**තීරණ අංක 22**</u>
ඉහත යෝජනාව සම්බන්ධව ගරු අණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව , කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර , සිරි සුගත විහාරයේ ඉදි කිරීමට නියමිත ධර්මශාලා ගොඩනැගිල්ල සඳහා සිමෙන්ති කොට්ට 25ක් ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**VI.** <u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමාගේ යෝජනා.**</u>

**01.** අළුපොත අශෝක ගුණවර්ධන මහතාගේ නිවස අසලින් දිද්දෙනිය දක්වා ඇති මාර්ගය සභාව වෙත පවරා ගෙන සිතියම් ගත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 23**</u>
ඉහත යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී ලවා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර , අළුපොත අශෝක ගුණවර්ධන මහතාගේ නිවස අසලින් දිද්දෙනිය දක්වා ඇති මාර්ගය සභාව වෙත පවරා ගෙන සිතියම් ගත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා.**

<u>**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන් ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර ප්‍රාදේශීය සභා මාර්ග සිතියම් ගත කිරීමේ පුහුණු වැඩමුළුවෙහි අදියර දෙක 2022 නොවැම්බර් මස 23 , 24 හා 25 යන දිනයන්හි දී ගොඩකවෙල බ්ලූ සෆායා හෝටල් පරිශ්‍රයේ දී පැවැත් වූ අතර ඒ සඳහා වැය වූ සම්පූර්ණ මුදලින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අදාල කොටස වන රු.17,439.70ක මුදල ( රු.296,475.00 / 17) ගොඩකවෙල ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 24**</u>
රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන් ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර ප්‍රාදේශීය සභා මාර්ග සිතියම් ගත කිරීමේ පුහුණු වැඩමුළුවෙහි අදියර දෙක 2022 නොවැම්බර් මස 23 , 24 හා 25 යන දිනයන්හි දී ගොඩකවෙල බ්ලූ සෆායා හෝටල් පරිශ්‍රයේ දී පැවැත් වූ අතර ඒ සඳහා වැය වූ සම්පූර්ණ මුදලින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අදාල කොටස වන රු.17,439.70ක මුදල ( රු.296,475.00 / 17) ගොඩකවෙල ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ප්‍රධාන කාර්යාලයේ , මාරපන උප කාර්යාලයේ හා කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර 04ක් සඳහා නඩත්තුව හා වාර්තා ලබා ගැනීම වෙනුවෙන් 2023.01.05 දින සිට 2024.01.04 දින දක්වා කාල සීමාවට අදාලව රු.62,000.00 ක මුදල එක්රේන් හෝල්ඩින්ග්ස් , නො.578 A , කොළඹ පාර , නව නගරය , රත්නපුර වෙත ගෙවීමට අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 25**</u>
ප්‍රධාන කාර්යාලයේ , මාරපන උප කාර්යාලයේ හා කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර 04ක් සඳහා නඩත්තුව හා වාර්තා ලබා ගැනීම වෙනුවෙන් 2023.01.05 දින සිට 2024.01.04 දින දක්වා කාල සීමාවට අදාලව රු.62,000.00 ක මුදල එක්රේන් හෝල්ඩින්ග්ස් , නො.578 A , කොළඹ පාර , නව නගරය , රත්නපුර වෙත ගෙවීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**03.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කිරිඳි ඇල්ල යටිතල පහසුකම් සංවර්ධනය කර සංචාරක කලාපයක් කිරීමට අදාලව , කිරිඳි ඇල්ල 2023 වර්ෂයේ සිට වර්ෂ 03ක කාලයකට බදු දීමට අදාලව සකස් කරන ලද ගිවිසුමට ගිවිසුම් ඇප මුදලක් තීරණය කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 26</u>
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කිරිඳි ඇල්ල යටිතල පහසුකම් සංවර්ධනය කර සංචාරක කලාපයක් කිරීමට අදාලව , කිරිඳි ඇල්ල 2023 වර්ෂයේ සිට වර්ෂ 03ක කාලයකට බදු දීමට අදාලව සකස් කරන ලද ගිවිසුමට ගිවිසුම් ඇප වශයෙන් රු.10,000.00 ක මුදලක් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**04.** නාරංගොඩ ජනපදය මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට අදාල රු.996,662.66 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 27</u>
නාරංගොඩ ජනපදය මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට අදාල රු.996,662.66 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක වාර්ථා සලකා බැලීම - 2022-12-08 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022.12.22 ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම.**

ඒ අනුව 2022-12-08 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව හා 2022.12.22 ටෙන්ඩර් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-12-01 සිට 2022-12-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2022.12.01 සිට 2022.12.31 දක්වා වූ ගෙවීම් වාර්තාවේ වවුචර් අංක 1965 හි PD – 7614 කැබ් රථයට ඉන්ධන ලීටර් 420ක් ලබා ගැනීම වෙනුවෙන් රු.177,000.00 ක මුදලක් ගෙවා ඇති බවත් ඒ එක් දිනක් වෙනුවෙන් ද යන්නය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ 2022 දෙසැම්බර් මස 05 , 12 , 14 , 16 , 19 , 23 හා 29 යන දිනයන්හි දී ලබා ගත් ඉන්ධන වෙනුවෙන් කළ ගෙවීම රු.177,000.00 ක් වන බව ය.

ඒ අනුව 2022-12-01 සිට 2022-12-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හාලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී .ඒ.ඉන්දික මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.</u>
අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක හොඳ නමුත් මෙම අවස්ථාවේ අඩු ආදායම්ලාභී අහිංසක දරුවන්ට පොත්පත් , මිනිසුන්ට බඩු මලු ලබා දීමට හැකි නම් වටිනා බවත් , ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකරතුමා ද ලිපි එවා ඇති බවත් ය.තව ද රජය විදුලි බිල නැවතත් වැඩි කිරීමට කටයුතු සකස් කර ඇති බවත් , මිනිස්සු දැන් පවතින බිල ගෙවන්නේ ද ඉතා අපහසුවෙන් බවත් , මේ සම්බන්ධව ජනතාවගේ බලවත් විරෝධයක් පවතින බවත් , එනිසා විදුලි බිල වැඩි නොකරන ලෙස රජයෙන් ඉල්ලා සිටින බවත් , ඒ සම්බන්ධව බලවත් විරෝධයත හා අප්‍රසාදය පල කරන බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ආර්ථික අපහසුතා පවතින නිසා විදුලි බිල වැඩි නොකරන ලෙස විදුලි බල අමාත්‍යාංශයට ඉල්ලීමක් සිදු කිරීම සුදුසු බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ විදුලිය කැපීමේ දී නිශ්චිත වෙලාවක් නොමැති බවත් , දිනකට කිහිප වරක් ම විදුලිය කප්පාදු කරන බවත් ය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා.</u>
පසුගිය දිනක සභාවේ ත්‍රීවිල් රථය වෙනත් ස්ථානයක පවතින බවට තමන් ලේකම්තුමාව දැනුවත් කළ බවත් , තමන් පුද්ගලයෙකුගේ නමක් එහි දී සඳහන් නොකළ බවත් , ලේකම්තුමා ඒ සම්බන්ධව සොයා බලා තිබූ බවත් , අද උදෑසන සභාවේ සේවක මහත්මයෙක් තමන්ට තර්ජනාත්මකව කතා කළ බවත් , එය සභාව ඇතුලත වීම සම්බන්ධව තමන් කණගාටුව ප්‍රකාශ කරන බවත් , සභාවේ මන්ත්‍රීවරයෙකුට සභාවට ඒමටත් යාමටත් අවස්ථාව තිබිය යුතු බවත් ය.

ඒ සම්බන්ධව සොයා බලන බවත් , එම සිද්ධිය පිළිබඳව ලේකම්තුමා විසින් තමන්ව ද දැනුවත් කළ බවත් , ත්‍රීවීලය එදින එම ස්ථානයට ගොස් නොමැති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ පොදු පරමාර්ථයක් ඇතුව සියලු දෙනා සමඟ ඇවිත් කටයුතු කළ බවත් , රට මේ වනවිට විශාල අර්බුදයක පවතින බවත් , ඊට හේතුව අපේ රටේ මුළු ජාතික ආදායමෙන් අපට ලැබෙන්නේ වාර්ෂික සාමාන්‍යයෙන් ඩොලර් මිලියන දොළොස්දහසක් පමණ වන බවත් , සාමාන්‍ය වියදම මිලියන විසිදහසක් පමණ වන බවත් , හිඟයක් පවතින බවත් , එය පියවා ගැනීමට රටේ පාලකයන් උත්සාහ නොකරන බවත් , රටෙහි ණය මෙපමණ ප්‍රමාණයක් ඇත්තේ ඒ නිසා බවත් ය.

මේ සියලු දෙයකටම සියලු ම ආණ්ඩු වගකිව යුතු බවත් , න්‍යාය පත්‍රයට ඇතුලත් කර මෙම කාරණය කතාකළ යුතු බවත් ගරු සභාපතිතුමා පවසඳන ලදී.

න්‍යාය පත්‍රයට ඇතුලත් කර තිබුනේ නම් අදහස් දැක්වීමට තිබූ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාද පවසන ලදී.

මාතොටින් එන උතුරු සුළඟේ...ගිනි සිඹින මඩු පල්ලියේ...දෑස් අගමුතු කඳුළු හංගන සරෝජා මගේ දෝණියේ....වෙඩි හඬට ඔබෙ අකුරු ඇඳවෙයි මක් කරන්නද දෝණියේ...ගුරුතුමී මා සිසුවියයි ඔබ ඒත් අපි එක පන්තියේ... ගීතය පවසමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ තමන් මෙම රටෙහි පවතින අර්බුදය පැවසූ බවත් , පාලකයො නිසා මෙම අර්බුදය ඇති වූ බවත් , එනිසා සියලු දෙනාම එමගින් බැට කන බවත් , මාතෘ භූමිය යහපත් රටක් කිරීමට අපි සියලු දෙනාම එකතු වී කටයුතු කරමු යන්නත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය පෙ.ව.11.00 ට පමණ සභාවට පැමිණෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ එක් පුද්ගලයෙකුට අනතුරුදායක ගස් කැපීමේ දී එකම ඉඩමෙ පවතින ගස් දෙකක් සඳහා අයදුම්පත්‍ර දෙකක් ලබා ගෙන රු.1,500.00 ක් ගෙවිය යුතු බව සභාවෙන් පවසා ඇති බවත් , අයදුම්පත්‍රයෙහි “ගස් වල උස” ලෙස සඳහන් වන බවත් , අයදුම්පත්‍ර 2ක් ගැනීමේ දී මිනිසුන් අසරණ වන බවත් , මේ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත් , එක් අවස්ථාවක පමණක් ගස් බැලීමට යන නිසා එසේ අයදුම්පත්‍ර 2ක ගාස්තු අය කළ යුතු නොමැති බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ නීතිමය ගැටළුවක් පවතින බවත් , ඒ සම්බන්ධව සලකා බලන බවත් ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ විධායක ඉංජිනේරු කාර්යාලයෙන් බෝපැත්ත පාර සුද්ධ කළ බවත් , එහි නඩත්තු කටයුතු පවතින බවත් ය.අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙවර නඩත්තු කටයුතු වලට දැමීමට කටයුතු කරන බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ඊළඟට එන මැතිවරණයේ දී ජනතාවගේ කැමැත්ත බලා ගත හැකි බවත් , ඒ වෙනුවෙන් කටයුතු කළ යුතු බවත් ය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පාතකඩ ගොඩගම පාරට යටින් දෝනාවන් ගොස් ඇති නිසා අනතුරුදායක බවත් , මාර්ගය දෙපැත්තෙම ඩෝසර් , බැකෝ දමා පතල් කපන බවත් , මාසයක කාලයකට මැණික් ගරා ගැනීමට වෙන්දේසි දමා රාජ්‍ය මැණික් සංස්ථාව සමඟ ආදායම ලබා ගෙන ඊට පසුව මෙම මාර්ගය සෑදීමට කටයුතු කළ බවට තමන් යෝජනා කරනා බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව කාර්මික නිලධාරීතුමාව ද සම්බන්ධ කර ගනිමින් මාර්ගය සකස් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත් , ඒ සඳහා ව්‍යාපාරික ප්‍රජාවගේ සහයෝගය ලබා ගන්නා බවත් , සභාවෙන් මාර්ග කම්කරුවන් දිය හැකි නම් වටිනා බවත් ය.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙල්වනායගම් රගවන් මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2023 පෙබරවාරි මස 09 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.11.10 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ......................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2023-02-09 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව